රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 24/2026

මගේ අංකය : PA/PSRD/02/19/1
රාජ්‍ය පරිපාලන,පළාත් සභා සහ
පළාත් පාලන අමාත්‍යාංශය
නිදහස් චතුරස්‍රය
කොළඹ 07.

2026.09.23

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
කොමිෂන් සභා ලේකම්වරුන්
දිස්ත්‍රික් ලේකම්වරුන්/ දෙපාර්තමේන්තු ප්‍රධානීන්

**රාජ්‍ය සේවයේ මානව සම්පත් කළමනාකරණ තොරතුරු පද්ධතිය - GovHR**
**පරිශීලක පැතිකඩ (User Profiles) සඳහා තොරතුරු ඇතුළත් කිරීම**

රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය මගින් රාජ්‍ය සේවයේ බඳවා ගැනීම්, ස්ථිර කිරීම්, උසස් කිරීම්, ස්ථාන මාරුවීම්, විශ්‍රාම ගැන්වීම් ඇතුළු මානව සම්පත් කළමනාකරණ ක්‍රියාවලීන් මාර්ගගත ක්‍රමයට ඉටු කිරීම සඳහා රාජ්‍ය සේවයේ මානව සම්පත් කළමනාකරණ තොරතුරු පද්ධතිය - GovHR හඳුන්වා දී ඇත.

02. පළමු අදියරේ දී පහත දීප ව්‍යාප්ත සේවාවන් හයක් (06) සහ ඒකාබද්ධ සේවාවන් තුනක් (03) සඳහා පද්ධතිය ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිතය.

- **දීප ව්‍යාප්ත සේවා**
  - i. ශ්‍රී ලංකා පරිපාලන සේවය
  - ii. ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවය
  - iii. ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය
  - iv. ශ්‍රී ලංකා ඉංජිනේරු සේවය
  - v. ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවය
  - vi. ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවය
- **ඒකාබද්ධ සේවා**
  - i. ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවය
  - ii. රජයේ භාෂා පරිවර්තක සේවය
  - iii. ශ්‍රී ලංකා රජයේ පුස්තකාලයාධිපති සේවය

03. ඔබ අමාත්‍යාංශය, පළාත් සභාව, කොමිෂන් සභා කාර්යාලය, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, දෙපාර්තමේන්තු සහ සියලුම රජයේ ආයතනවල ඉහත සඳහන් සේවාවන්ට අදාළ නිලධාරීන්ට මෙම තොරතුරු පද්ධතියට පිවිසීම සඳහා එම නිලධාරීන්ගේ ජංගම දුරකථන වෙත පරිශීලක නාමය (User Name), මුරපදය (Password) හා සබැඳිය (URL) https://govhr.gov.lk, GovHR පද්ධතිය මඟින් කෙටි පණිවිඩයක් (SMS) ලෙස යොමු කරනු ඇත.

04. එම පරිශීලක නාමය හා මුර පදය භාවිතා කර ඉහත සඳහන් සබැඳිය ඔස්සේ GovHR පද්ධතියට පළමු වරට පිවිසීමෙන් අනතුරුව මුරපදය වහාම වෙනස් කර ගත යුතුය. අනතුරුව 02 වන ඡේදයෙහි සඳහන් සේවාවන්ට අයත් නිලධාරීන් විසින් තම තොරතුරු ඇතුළත් කර තම පරිශීලක පැතිකඩ (User Profile) සම්පූර්ණ කළ යුතුය. පරිශීලක පැතිකඩ සම්පූර්ණ කිරීමට අදාළ මාර්ගෝපදේශ සඳහා වන පරිශීලක අත්පොත (User Manual) සහ වීඩියෝව https://govhr.gov.lk සබැඳිය මඟින් බාගත කළ හැකිය.

05. ඉහත සඳහන් සේවාවන්හි නිලධාරීන්ගේ සේවයේ ස්ථිර කිරීම්, ස්ථානමාරු වීම්, උසස්වීම් ආදී මානව සම්පත් කළමනාකරණ ක්‍රියාවලීන් ඉදිරියේදී මෙම පද්ධතිය මඟින් පමණක් සිදුකරනු ලබන බැවින් ඊට ප්‍රථම පරිශීලක පැතිකඩ නිවැරදිව සම්පූර්ණ කිරීම අත්‍යවශ්‍ය වේ.

06. එබැවින් අදාළ තොරතුරු ඇතුළත් කිරීම සඳහා උක්ත 02 ඡේදයෙහි සඳහන් සේවාවන්ට අයත් නිලධාරීන් දැනුවත් කරන මෙන් කාරුණිකව දන්වමි.

07. පරිශීලක නාමය හෝ මුරපදය ලැබී නොමැති නම් හෝ GovHR පද්ධතියට ප්‍රවේශ වීමේ යම් ගැටළුවක් පවතින්නේ නම් පහත දුරකථන අංක ඇමතීමෙන් හෝ විද්‍යුත් ලිපියක් යොමු කිරීමෙන් ගැටළු නිරාකරණය කරගත හැකිය.

0112696211/13 ⎫ දිගුව 812 - තොරතුරු තාක්ෂණ අංශය - itdinfo@pubad.gov.lk
0112166000 ⎭ දිගුව 138 - රාජ්‍ය සේවා ප්‍රතිසංස්කරණ අංශය - reformsdiv@pubad.gov.lk
0112196604 - රාජ්‍ය සේවා ප්‍රතිසංස්කරණ අංශය

08. තවද, GovHR පද්ධතිය මඟින් මානව සම්පත් ක්‍රියාවලීන් මාර්ගගත ක්‍රමයට ඉටු කිරීම සම්බන්ධයෙන් උපදෙස් ඉදිරියේදී නිකුත් කරනු ඇත.

09. රාජ්‍ය සේවය ඩිජිටල්කරණය මඟින් වඩාත් කාර්යක්ෂම, සුහුරු රාජ්‍ය සේවාවක් ලබා දීමේ ඉතා වැදගත් පියවරක් ලෙස මෙම මානව සම්පත් කළමනාකරණ පද්ධතිය ස්ථාපනය කර ඇති බැවින් ඔබ විසින් මෙම කාර්යය සාර්ථක කර ගැනීමට දක්වන සහයෝගය ඉතා අගය කොට සලකමි.


එස්. ආලෝකබණ්ඩාර
ලේකම්
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය

දුරකථන : 0112662340
ෆැක්ස් : 0112695279
විද්‍යුත් ලිපිනය : info@pubad.gov.lk